# (44) ඉස්ලාම්

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

**I පත්‍රය - කාලය : පැය 02යි.**

වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න **50කි.** ප්‍රශ්න **සියල්ලට** ම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **01** බැගින් මුළු **ලකුණු 50කි.**

**II පත්‍රය - කාලය : පැය 03යි.** (ඊට අමතරව කියවීම් කාලය මිනිත්තු 10 යි.)

මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත වේ.

I කොටස - අර්ධ ව්‍යුහගත ප්‍රශ්න **තුනකි.** ප්‍රශ්න **දෙකකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40කි.

II කොටස - රචනා වර්ගයේ ප්‍රශ්න **පහකි.** ප්‍රශ්න **තුනකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 60කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු = 100

අවසාන ලකුණ ගණනය කිරීම :

| | | |
|---|---|---|
| I පත්‍රය | = | 50 |
| II පත්‍රය | = | 100 ÷ 2 = 50 |
| අවසාන ලකුණ | = | 100 |

### I පත්‍රය

**සැලකිය යුතු යි :**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුයි.
* **නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ** පිළිතුර තෝරාගත යුතු යි. (විභාගයේ දී පිළිතුරු සැපයීම සඳහා බහුවරණ කඩදාසියක් සපයනු ලැබේ.)

---

**1.** පහත සඳහන් පුද්ගලයින්ගෙන් ආධ්‍යාත්මික ක්ෂේත්‍රයේ ප්‍රසිද්ධියට පත් වූ යේ කවුද ?

(1) ඉබ්‍රහීම් ඉබ්නු අද්හම් (රහ්)
(2) මුහම්මද් ඉබ්නු ඉස්මාඊල් (රහ්)
(3) නුමාන් බින් සාබිත් (රහ්)
(4) උමර් ඉබ්නු අබ්දුල් අසීස් (රහ්)
(5) උස්මාන් ඉබ්නු මල්ඌන් (රලි)

**2.** ඉස්ලාමය වැළඳගත් ජාහිලියියා ජනයා නැවතත් කුෆ්ර්ට යොමු නොවී රඳවා ගන්නා ලද ගුණාංගය වන්නේ,

(1) එඩිතරකම යි.
(2) සරළ හා චාම් බව යි.
(3) ආගන්තුක සත්කාරය යි.
(4) පොරොන්දු කඩ නොකිරීම යි.
(5) පතිවෘතතාවය යි.

**3.** ඉස්ලාම් අනුමත කළ ව්‍යාපාරික ක්ෂේත්‍රයේ කෘෂිකාර්මික කොටස් ව්‍යාපාරය හැඳින්වෙන්නේ කවර නමකින්ද?

(1) මූෂාරකා (2) මුසාරආ (3) මුලාරබා (4) මරාබහා (5) බයිඋල මුඅජ්ජල්

**4.** දාවූද් (අලෛ) සකරියා (අලෛ) යන නබිවරුන් විසින් සිදුකරන ලද ඉපයීම් මාර්ග පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?

(1) ලෝහ වැඩ හා කෘෂිකර්මාන්තය යි.
(2) නැව් තැනීම හා කෘෂිකර්මාන්තය යි.
(3) ලෝහ වැඩ හා වඩු කර්මාන්තය යි.
(4) ව්‍යාපාර හා වඩු කර්මාන්තය යි.
(5) කෘෂිකර්මාන්තය හා සත්ව පාලනය යි.

**5.** ධන සම්පත් අවශ්‍යතාව අනුව වියදම් කිරීම හා බෙදාදීම සම්බන්ධ උමර් ඉබුනු අබ්දුල් අසීස් (රහ්) තුමන්ගේ ප්‍රකාශය කුමක් ද?

(1) ඔබ දුප්පතෙකුට යමක් ලබා දුනහොත් ඔහුට තවත් කෙනෙකුගෙන් තවදුරටත් ලබා ගැනීමට ඉඩ නොතබා දෙන්න.

(2) මා හට ඉෂ්ඨ කිරීමට නොහැකි වූ වගකීම් ඉටු කිරීමට මට අවකාෂය ලැබුවේ නම් ධනවතුන්ගෙන් ලබා ගෙන දුප්පතුන්ට බෙදා හරින්නෙමි.

(3) දුගී ජනයාගේ නඩත්තුවට අවශ්‍ය ප්‍රමාණවත් සම්පත් අල්ලාහ් විසින් පොහොසතුන් වෙත ලබා දී ඇත.

(4) දුප්පතුන්, අනාථ දරුවන්, ණයකරුවන්, විවාහ අපේක්ෂිත නමුත් වත්කම් නැති අය මාගෙන් උපකාර ලබා ගත හැකි ය.

(5) ඔවුන් සතු ධනයෙහි සිඟමන් යදින්නවුන්ටත් නැති බැරි අයටත් හිමිකමක් ඇත.

**6.** ''එක් මුස්ලිම් අයකු තවත් මුස්ලිම් අයකුට දෙවතාවක් ණය දුනහොත් ඉන් එක් වතාවක් සදකා දුන් තැනැත්තකු සේ සැලකේ'' යන ප්‍රකාශය

(1) නබි තුමන්ගේ ප්‍රකාශය යි.
(2) අල් කුර්ආන් ප්‍රකාශය යි.
(3) පාලකයකුගේ ප්‍රකාශය යි.
(4) ඉමාම්වරයකුගේ ප්‍රකාශය යි.
(5) සහාබිවරයකුගේ ප්‍රකාශය යි.

**7.** යම් පුද්ගලයකුගේ තව්බා පිළිගැනීමට ලක්වීමට අවශ්‍ය කොන්දේසියක් වන්නේ කුමක්ද ?

(1) කළ අකුසලය වෙනුවෙන් අරාබි බසින් පව් සමාව අයැදීම
(2) පව් සමාව ඉල්ලා කඳුළු වැගිරීම
(3) ලෛලතුල් කද්ර් රාත්‍රියේ අදාළ අකුසල් වෙනුවෙන් පව් සමාව අයැදීම
(4) අකුසලයට හිලව් වශයෙන් අධික ලෙස දන් දීම
(5) අදාළ අකුසල් ක්‍රියාව යළි නොකරන බවට දැඩි ලෙස අධිෂ්ඨාන කර ගැනීම

**8.** ''බිස්මිකල්ලාහුම්ම'' යන ප්‍රාරම්භක වැකිය වන්නේ,

(1) ජාහිලියා සමයේ වූ සම්ප්‍රදායකි.
(2) නබිතුමාගේ සමයේ වූ සම්ප්‍රදායකි.
(3) කුලාෆාවරුන්ගේ සමයේ වූ සම්ප්‍රදායකි.
(4) උමයියාවරුන්ගේ සමයේ වූ සම්ප්‍රදායකි.
(5) නූතනකාලයේ සම්ප්‍රදායකි.

**9.** පූර්ව ඉස්ලාමික සමයේ ජාහිලියියා ගති ලක්ෂණවලින් මිදී සත්‍යය මත පිහිටා කටයුතු කළ පුද්ගලයා කවුද ?

(1) කුස් ඉබුනු සාඉදා
(2) අබූ කුහාෆා
(3) සෛද් ඉබුනු හාරිදා
(4) උස්මාන් ඉබුනු අෆ්වාන්
(5) උමර් ඉබුනු කත්තාබ්

**10.** මුහම්මද් (සල්) තුමන්ට පසුව තවත් නබිවරයකු පහළ වීමේ කිසිදු අවශ්‍යතාවක් නැත යන්නට ප්‍රධාන හේතුව කුමක් ද?

(1) ඉස්ලාම් හි දේශනා සියල්ල අරාබි භාෂාවෙන් සිදු කර තිබීම
(2) මුහම්මද් (සල්) තුමන්ගේ චරිතාපදානය අඩංගු ග්‍රන්ථ නිකුත් වෙමින් තිබීම
(3) පර්යේෂණ තුළින් හදීස් වර්ග කර තිබීම
(4) නබි (සල්) තුමන්ගේ අනුගාමිකයන් එතුමන්ව අනුගමනය කරමින් සිටීම
(5) අල්කුර්ආන්හි ආරක්ෂාව අල්ලාහ් විසින්ම සහතික කොට තිබීම

**11.** ඉස්ලාම් දහමට අනුව ඇඳුම් පැළඳීමේ අරමුණු වන්නේ පහත ප්‍රකාශ අතුරින් කවරක් ද?

(1) ශරීරය ආවරණය කොට විළිබිය රැකගෙන තම පෙනුම ප්‍රසන්න ලෙස තබා ගැනීම
(2) පෙනුම ප්‍රසන්න ලෙසත් පිවිතුරු ලෙසත් තබා ගැනීම
(3) ශරීරය අලංකාර ලෙස පවත්වා ගැනීම
(4) සභ්‍යත්වය රැකගෙන අනන්‍යතාව ආරක්ෂා කර ගැනීම
(5) බාහිර ස්වරූපය පිළිවෙළකටත් ශරීරය පවිත්‍ර ලෙසත් තබා ගැනීම

**12.** ''මිනිසා මිනිසාට වහල් වීමෙන් මුදවා අල්ලාහ්ට පමණක් යටත් වීම සඳහා පමණක්ම අල්ලාහ් විසින් අප එවනු ලැබීය.'' යනුවෙන් පර්සියානු සෙන්පති රුස්තුම් හමුවේ පවසා සිටියේ,

(1) උමර් ඉබුනු කත්තාබ් (රලි) ය.
(2) කාලිද් ඉබුනු වලිද් (රලි) ය.
(3) රුබ්ආ ඉබුනු ආමිර් (රලි) ය.
(4) සඅද් ඉබුනු අබීවක්කාස් (රලි) ය.
(5) අම්ර් ඉබුනු වලීද් (රලි) ය.

**13.** පහත සඳහන් ප්‍රකාශ අතුරින් ඉස්ලාමීය ආර්ථික සංකල්පයට පටහැනි ප්‍රකාශය කුමක් ද?

(1) සියලු සම්පත් අල්ලාහ්ට හිමි ය.
(2) පුද්ගලික දේපලෙහි සමාජයටත් හිමිකමක් ඇත.
(3) වියදම් කිරීම හා ඉතිරි කිරීම ආදියෙහි මධ්‍යස්ථ බව රැකීම ය.
(4) සම්පත් වනාහි මිනිසා පරීක්ෂාවට ලක් කිරීම පිණිස ලබා දුන් බව ය.
(5) සම්පත් වනාහි මිනිස් ශ්‍රමය තුළින් ලබා ගන්නා බව ය.

**14.** ඉස්ලාමීය පසු උරුමකාරත්ව නීතියෙහි ''හජ්බුන් නුක්සාන්'' යනු,

(1) යම් කෙනෙකු ජීවත් ව සිටීම හේතුවෙන් වෙනත් සමහර අයට දේපළවලින් කොටස් උරුමය සහමුලින්ම අහිමි වීම.
(2) යම් කෙනෙකු ජීවතුන් අතර සිටීම හේතුවෙන් සමහර අයට අදාළ දේපළවලින් උරුම විය යුතු කොටස අඩුවෙන් ලැබීම
(3) මරණයට පත් අයගේ පසු උරුමක්කරුවන් බාලවයස්කරුවන් වීම ය.
(4) පසු උරුමක්කරුවන් වෙත වගකීම් පැවරී තිබීම ය.
(5) දේපළ හිමිකරු පසු උරුමකරු විසින් ඝාතනය කර තිබීම ය.

**15.** මදීනා හා එයට උතුරු දිසාවේ සිට පැමිණෙන ඉහ්රාම් අය හජ් හා උම්රා ඉටු කිරීමට බැඳිය යුතු ''මීකාතය'' වන්නේ,

(1) අල් ජුහ්ෆා ය.
(2) යලම්ලම් ය.
(3) කර්නුල් මනාසිල් ය.
(4) දුල් හුලෛෆා ය.
(5) දාතුල් ඉරාක් ය.

**16.** කලීෆා උස්මාන් (රලි) මෙන්ම අලි (රලි) තුමන්ලාගේ පාලන සමයේ රටතුළ කලහකාරී තත්ත්වයක් ඇති වීමට හේතු වූ තැනැත්තා,

(1) අබ්දුල්ලා බින් උබෛ ය.
(2) අබ්දුල්ලාබින් සබා ය.
(3) අබූ ලුඃලුඃ ෆයිරූස්
(4) උබයි ඉබුනු සුලූල් ය.
(5) අම්ර් ඉබුනු ලුහෛය ය.

**17.** පහත ප්‍රකාශ සලකන්න.

A - ඉස්ලාම් හි ප්‍රධාන වූ මූලාශ්‍ර වහී මත පදනම් ව සකස් වූ ඒවා ය.
B - මුහම්මද් (සල්) තුමාගේ දේශනා අරාබි භාෂාව කථාකරන අයට සීමාවෙයි.
C - මිනිසා අල්ලාහ්ගේ නියෝජිතයා ය.
D - ඉස්ලාම් ලෞකික ජීවිතයෙන් මිදී ජීවත් වීමට අණ කරයි.
E - ඉස්ලාම් සමාජ ව්‍යූහයට වඩා තනි පුද්ගලයන්ට මුල්තැන දෙයි.
F - ඉස්ලාම් සෑම යුගයකටම මෙන්ම ලොවේ සෑම ප්‍රදේශයකටමත් යෝග්‍ය වේ.

ඉහත ප්‍රකාශ අතුරින් ඉස්ලාමයේ විශේෂාංග අයත් වරණය කුමක් ද?

(1) A, B හා C ය. (2) A, C හා D ය. (3) A, C හා F ය. (4) B, E හා F ය. (5) D, E හා F ය.

- ප්‍රශ්න අංක 18 සිට 23 දක්වා වන සෑම ප්‍රශ්නයකට ම **X** සහ **Y** යන තීරු යටතේ දී ඇති තොරතුරු සලකන්න. **X** හි සඳහන් තොරතුරුවලට කිසියම් හෝ ආකාරයක සම්බන්ධතාවයක් ඇති Y තීරුවේ දී ඇති ප්‍රකාශයන් හි අක්ෂර අනුපිළිවෙල තෝරන්න.

**18.** **X** තීරුව | **Y** තීරුව

(i) මක්බූල් — A - ඉස්නාදිල් සහාබි ගිලිහුනු හදීස්
(ii) මව්කූෆ් — B - මවන ලද හදීස්
(iii) මර්සල් — C - පිළිගත යුතු හදීස්
(iv) මව්ළූ — D - සහබි සමඟ සනද් නිමා වූ හදීස්

(1) A B D C (2) B A D C (3) C D A B (4) D A B C (5) D A C B

**19.** **X** තීරුව | **Y** තීරුව

(i) රබ්බානියියා — A - යථාර්ථවාදය
(ii) ඉන්සානියියා — B - දේවත්ව ස්වභාවයෙන් යුත්තය
(iii) වාකිඉයියා — C - පරිපූර්ණ බවින් යුක්තය
(iv) ෂුමුලියියා — D - මානව දයාවෙන් යුක්තය

(1) A B D C (2) B A C D (3) B D A C (4) B D C A (5) C A D B

**20.** **X** තීරුව | **Y** තීරුව

(i) කිලාෆත් — A - වගකීම් පැවරීම
(ii) රිසාලත් — B - නික්ම යාම
(iii) හිදායත් — C - දේවපණිවිඩය
(iv) හිජ්රත් — D - ඍජුමග
(v) වකාලත් — E - නියෝජිත පාලනය

(1) A C E B D (2) B E C D A (3) D B C E A (4) D B C A E (5) E C D B A

**21.** **X** තීරුව | **Y** තීරුව

(i) ඉමාම් නෑමාන් බින් සාබිත් (රහ්) — A - සහීහ් බුහාරි
(ii) ඉමාම් මුහම්මද් ඉබුනු ඉද්රීස් (රහ්) — B - මුවත්තා
(iii) ඉමාම් අහමද් ඉබුනු හන්බල් (රහ්) — C - රිසාලතුල් උසූලියා
(iv) මුහම්මද් ඉබුනු ඉස්මාඊල් (රහ්) — D - මුස්නද් අහ්මද්
(v) අනස් ඉබුනු මාලික් (රහ්) — E - ෆික්හුල් අක්බර්

(1) A D E B C (2) B C D A E (3) C D B A E (4) D C B C A (5) E C D A B

**22.** **X** තීරුව | **Y** තීරුව

(i) සම්සරා — A - අත්තිකාරම් දීම
(ii) රහ්න් — B - හවුල් ව්‍යාපාර
(iii) ඉජාරා — C - උකස් තැබීම
(iv) මුලාරබා — D - කුලී පදනම
(v) සලම් — E - තැරව්කාර ව්‍යාපාර

(1) A D E B C (2) B C D A E (3) C D B A E (4) E C D B A (5) E D B C A

**23.** ''දාරුන් නද්වා'' නම් වූ සභාව ස්ථාපිත කළේ,

(1) අබ්දුල් මුත්තලිබ්යා ය.

(2) කුසෛ ඉබුනු කිලාබ් ය.

(3) අබුදුහ් ෂම්ස් ය.

(4) අබු සුෆ්යාන් බින් හර්බ් ය.

(5) හම්සා බින් අබ්දුල් මුත්තලිබ් ය.

**24.** ''ඉබුනු සබීල්'' නමින් හැඳින්වෙන කාණ්ඩයට සකාත් හිමිකම් ලැබීමට හේතුව ඔවුන්

(1) අල්ලාහ්ගේ මාර්ගයෙහි සේවයට කැපවී සිටීම ය.

(2) තමන් විසින් ලබා ගත් ණය ආපසු ගෙවා ගැනීමට නොහැකිව සිටීම ය.

(3) වහල් බාවයෙන් නිදහස් කළ යුතුව සිටීම ය.

(4) අනුමත සංචාරය (ගමන) දුෂ්කරතාවලින් තොරව අවසන් කරගත යුතුව ඇත්තන් ය.

(5) සකාත් ඒකරාශි කර සුදුස්සන්ට බෙදාහරින්නනුවන් ය.

**25.** අල් හදීස් හි ''සනද්'' සම්බන්ධව අධ්‍යයනය කරන කලාව වන්නේ කුමක් ද?

(1) උසුලුල් හදීස්

(2) තඛ්රීජුල් හදීස්

(3) අස්මාඋර් රිජාල්

(4) මුස්තලහුල් හදීස්

(5) ඉල්මුල් හදීස්

**26.** පොදු යහපත පවත්වා ගැනීමට ඉවහල් වන ඉස්ලාමීය වගකීම වන්නේ කුමක් ද?

(1) සලාතය

(2) උපවාසය

(3) සකාත්

(4) උම්රා

(5) හජ්

**27.** දෙමාපියන් මරණයට පත් වූ පසුව දරුවන් විසින් ඔවුන් හා සම්බන්ධව ඉටු කළ යුතු වැදගත් වගකීමක් වන්නේ,

(1) ඔවුන්ගේ කබ්ර් තිබෙන ස්ථාන සියාරාත් කිරීම ය.

(2) ඔවුන් උදෙසා දාන මාන ආදිය දීම ය.

(3) ඔවුන් නිතර නිතර මෙනෙහි කොට ප්‍රශංසා කිරීම ය.

(4) ඔවුන්ගේ වසියත් නිසි ලෙස ඉටු කිරීම ය.

(5) ඔවුන් සතු දේපල නිසි ලෙස බෙදා ගැනීම ය.

**28.** හජ් හි වාජිබ්වූ වගකීම්වලින් එකක් මග හැරීම හේතුවෙන් ෆිද්යා ලෙස එක් එළුවකු කුර්බාන් කළ නොහැකි අයකු,

(1) හරම්හි ජීවත්වන මිස්කීන්වරු තිදෙනකුට ආහාර දන් දිය යුතු ය.

(2) මක්කාහි දී උපවාස තුනක් කළ යුතු ය.

(3) මදීනාවේ දී උපවාස හතක් කළ යුතු ය.

(4) මක්කාවේ දින දෙකක් ද මදීනාවේ දින හතක් ද උපවාස කළ යුතු ය.

(5) මක්කාවේ දින තුනක් ද තම ගමට ආවිගස දින 7ක් ද උපවාස කළ යුතු ය.

**29.** කරුණු දෙකක් මත මිස වෙනත් කිසිදු හේතුවක් නිසා හෝ මිනිසා ඊර්ෂියා නොකළ යුතු බව හදිස් හි සඳහන් ව ඇත. එම කරුණු දෙක වන්නේ,

(1) දැනුම ලබා ඒ අනුව කටයුතු කිරීම හා ඉබාදත් වල වැඩි කාලයක් ගත කිරීම ය.

(2) ජනතාව වෙනුවෙන් කායිකව වෙහෙසීම හා අල්ලාහ්ගේ මාර්ගයෙහි වියදම් කිරීම ය.

(3) සදකා දීම හා සමාජ සුබ සාධන කටයුතුවල නියැලීම ය.

(4) වැඩි වශයෙන් උපවාස කිරීම හා රාත්‍රී කාලයේ ඉබාදත්වල යෙදීම ය.

(5) දැනුම ලබා ඒ අනුව ක්‍රියාතමක වීම හා ධන සම්පත් ලැබ එය අල්ලාහ්ගේ මාර්ගයේ වියදම් කිරීම ය.

**30.** පහත සඳහන් කරුණු සලකන්න.

A - තසව්වුෆ් යනු තපස් ජීවිත සංකල්පය යි.

B - මොන්ගෝලියානුවන් ඉස්ලාමය වැළඳ ගැනීමට සූෆි උත්තමයින් හේතු වූහ.

C - තසව්වුෆ් සංකල්පය නබිතුමන්ගේ සමයේ පටන්ම පැවති එකකි.

D - ඉස්ලාමීය ලෝකයේ ෂාදුලියා, සහ්රවර්දියා සහ නක්ෂබන්දියා වැනි තරීක්කා සංවිධාන තසව්වුෆ් සංකල්පය ඉදිරිපත් කළේ ය.

E - මුස්ලිම් සමාජය බටහිර චින්තනයේ බලපෑම්වලින් ආරක්ෂා කර ගැනීමට තරීක්කා සංවිධාන සිය දායකත්වය ලබා දී ඇත.

ඉහත කරුණු වලින් තසවුෆ් හා සම්බන්ධව ප්‍රකාශ පමණක් අඩංගු වරණය තෝරන්න.

(1) A, B හා C ය. (2) B, D හා E ය. (3) B, C හා D ය. (4) B, C හා E ය. (5) C, D හා B ය.

**31.** කලීෆා ලෙසත් මුජ්තහිද් ලෙසත් සැළකෙන උත්තමයා කවුරුන් ද? ,

(1) උමර් ඉබුනු අබ්දුල් අසීස් (රහ්)

(2) උමර් ඉබුනු කත්තාබ් (රලි)

(3) මුහම්මද් අල් ෆාතිහ් (රහ්)

(4) සුල්තාන් සලාහුද්දීන් (රහ්)

(5) සුල්තාන් අබ්දුල් හමීද් (රහ්)

**32.** පහත සඳහන් කරුණු සලකන්න.

A - අල්ලාහ්ගේත් ඔහුගේ දූතයාගේත් මගපෙන්වීම මත ගොඩනගන ලද්දකි.

B - ඉස්ලාමීය සමාජ ව්‍යුහය අනෙකුත් සමාජ ව්‍යුහයන් සමඟ පැවතිය යුතු සම්බන්ධතා අනුමත කරයි.

C - ඉස්ලාමීය සමාජ ව්‍යුහයේ පදනම තුළ තසව්වුෆ් ප්‍රධාන ස්ථානයක් හිමි කර ගනී.

D - ඉස්ලාමීය ඉගැන්වීම් හුදෙක්ම පුද්ගල කේන්ද්‍රීයව නොව සමාජ කේන්ද්‍රීයව ගොඩ නැගී ඇත.

E - ඉස්ලාමීය සමාජ ක්‍රමය රටින් රටට වෙනස් වේ.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් ඉස්ලාමීය සමාජ ව්‍යුහය හා සම්බන්ධ මත පමණක් දැක්වෙන අක්ෂර අඩංගු වරණය තෝරන්න.

(1) A, B හා C ය. (2) A, B හා D ය. (3) A, C හා E ය. (4) B, C හා D ය. (5) B, D හා E ය.

**33.** මිනිස් අයිතිවාසිකම් සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් මෙසේය.

A - 1948 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත් කරන ලද මානව හිමිකම් ප්‍රකාශනය මදීනා සම්මුතිය හා සමාන බවක් පෙන්වයි

B - ඉස්ලාම් ලබා දී ඇති අයිතීන් සියල්ල නබිතුමන් විසින්ම හඳුන්වා දෙන ලද ඒවාය.

C - මිනිස් අයිතිවාසිකම් අයුක්තියට එරෙහිව සටන් කිරීමේ අයිතිය තහනම් කර ඇත.

D - මිනිසාගේ ආත්ම ගරුත්වය ආරක්ෂා කළ යුතු වේ.

E - මිනිසාට ජීවත් වීමට ඇති මූලික අයිතීන් සුරක්ෂිත කළ යුතු ය.

මේවා අතුරින් ඉස්ලාම් මඟින් ලබා දී ඇති මානව හිමිකම් හා සම්බන්ධ ප්‍රකාශවල වඩාත් ම නිවැරදි එකතුව වන්නේ,

(1) A, B හා E ය. (2) A, D හා E ය. (3) B, D හා E ය. (4) C, B හා E ය. (5) C, D හා E ය.

**34.** ඉජ්තිහාද් මත පදනම්ව බිහි වූ (නීති) මූලාශ්‍ර වන්නේ,

(1) අල් හදීස් - අල් ඉජ්මාඋ ය.

(2) අල් හදීස් - අල් කියාස් ය.

(3) අල් ඉජ්මාඋ ය.

(4) අල් ඉස්තිහ්සාන් - ෂරඋ සාබිකා ය.

(5) ඉහත සඳහන් සියල්ල ම ය.

**35.** නීතිමය තීරණ හා විධි විධාන ලබා ගැනීමේ දී ඉමාම්වරයකුගේ කොන්දේසි පිළිපදින්නා,

(1) මුජ්තහිද් බිල් පත්වා ය.

(2) මුජ්තහිද් බිල් මද්හබ් ය.

(3) මුජ්තහිද් මුන්තසිබ් ය.

(4) මුජ්තහිද් මුත්ලක් ය.

(5) මුජ්තහිද් බිල් මාසාඉල් ය.

**36.** ආහාද් වර්ගයට අයත් හදීස් අතර ඉස්නාද්හි දක්නට ලැබෙන ගිලිහීම් මත වර්ගීකරණය කරන ලද හදිස් වර්ග දෙක කුමක් ද?

(1) මුර්සල් - මර්ෆූඋ
(2) මෂ්හූර් - මක්තූඋ
(3) මුඅල්ලක් - මව්කූෆ්
(4) මුන්කතිඋ - මුඅල්ලත්
(5) අල්මෂ්හූර් - අල්අසීස්

**37.** ඉජ්මාඋස් සුකූති සම්බන්ධ වඩාත් ම නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) මුජ්තහිද් සැමදෙනා ම ඒකමතික ව එකම මතයකට පැමිණීම ය.
(2) මුජ්තහිද්වරු සැමදෙනාම තම තමන්ගේ මත පැහැදිලිව ප්‍රකාශ කර තිබීම ය.
(3) සමහර මුජ්තහිද්වරුන් තම මතය ප්‍රකාශ කරන අතරතුර සමහර මුජ්තහිද්වරුන් එම මතය පිළිගෙන ප්‍රකාශයක් නොකොට නිශ්ශබ්දව සිටීම ය.
(4) යම් කරුණක් සම්බන්ධ ව මුජ්තහින්දවරුන්ගෙන් එක් පිරිසක් එක් මතයක් දරන විට තවත් පිරිසක් ඒ සම්බන්ධ ව වෙනත් ප්‍රතිවිරුද්ධ මතයක් දැරීම ය.
(5) මුජ්තහිද්වරුන්ගෙන් බහුතරයක් පිළිගැනීම ය.

**38.** වසරක් පුරා එළුවන් 400ක හිමිකරුවෙක් ඒ සඳහා ලබා දිය යුතු සකාත් ප්‍රමාණය

(1) එළුවන් දෙදෙනකි.
(2) එළුවන් තිදෙනකි.
(3) එළුවන් සිව්දෙනෙකි.
(4) එළුවන් පස්දෙනෙකි.
(5) එක් ගවයෙකි.

- අංක **39** සිට **44** දක්වා වූ ප්‍රශ්නවල දෙවර්ගයක ප්‍රකාශ ලබා දී ඇත. මෙසේ ලබා දී ඇති යුගලවලට මතු සඳහන් **(1), (2), (3), (4)** හා **(5)** අතුරින් වඩාත් ම නිවැරදි වචනය හෝ වාක්‍ය තෝරා එහි අංකය ලියන්න.

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| **1** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **2** | වැරදි ය. | නිවැරදි ය. |
| **3** | නිවැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | වැරදි ය. |
| **5** | නිවැරදි ය. | **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | **පළමුවැනි ප්‍රකාශනය** | **දෙවැනි ප්‍රකාශනය** |
|---|---|---|
| **38.** | ඉල්හාද් සංකල්පය පළමු ව හනීෆ්වරුන් විසින් ඇති කරන ලදී. | අබ්දුල්ලා හ් ඉබුනු උබෛ මුල්හිද් වරුන්ගෙන් එක් අයෙකි. |
| **40.** | කවාරිජ්වරු සිෆ්ෆීන් යුද්ධයේ දී බිහි වූ කණ්ඩායමකි. | පළමු කලීෆා විය යුතු ව තිබුණේත් ඉමාම් විය යුතු ව තිබුණේත් අලි (රලි) තුමන් ය යන මතයේ පිහිටා සිට බිහි වූවෝ ෂියාවරුන් ය. |
| **41.** | මක්කී හා මදනි වාක්‍යය අර්ථය හා භාෂා ශෛලය අතරින් එක සමාන ය. | අල්කුරාන් හි නාසික්-මන්සූක් වශයෙන් සමහර වාක්‍ය දක්නට ඇත. |
| **42.** | මුජ්තහිද් මුත්ලක් යනු ඉජ්තිහාද් සිදු කිරීමට පළමු පෙළේ සුදුසුකම ලැබූවන් ය. | කියාස් හා සහාවරුන්ගේ ඉජ්මා සම මට්ටමෙන් සැලකේ. |
| **43.** | සිය ස්වාමි පුරුෂයා මිය යන විට බිරිඳ වඩා මහලුවියට පත්ව ඇති නම් මාස 4 දින 10ක ඉද්දා කාලය අත්‍යාවශ්‍ය නොවේ. | තලාක් ලැබූ ස්ත්‍රියක් කුර්උ තුනක් ඉද්දා අනිවාර්යයෙන්ම සිටිය යුතු ය. |

**44.** ඉස්ලාමික ඉතිහාසයේ බිහි වූ අකීදා ප්‍රතිපත්ති හා බැඳුනු කොටස් අතර කවාරිජ්වරුන්,මුඃතසිලාවරුන් සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශවලින් වඩාත් ම ගැළපෙන ප්‍රකාශය වන්නේ කුමක් ද?

(1) පළමු කාණ්ඩය අලි (රලි) කලීෆා ලෙස පත් වී සිටිය යුතු බවත්, දෙවන කාණ්ඩය සැඟවී ගිය ඉමාම් මුහම්මද් අස්කර් නැවත පැමිණේ යැයි විශ්වාස කරයි.

(2) පළමු කාණ්ඩය ෂෆාත්අත් තිබෙන බවත්, දෙවන කාණ්ඩය අල්කුර්ආන් නිර්මාණයක් ලෙසත් සලකයි.

(3) පළමු කාණ්ඩය බහුතරයක් සහාබිවරුන්ව කාෆිර් ලෙසත් දෙවන කාණ්ඩය අවසන් දිනයේ දී අල්ලාහ් දර්ශනය කර ගත හැකි බවත් විශ්වාස කරයි.

(4) පළමු කාණ්ඩය මහා පාපක්‍රියාවල යෙදුන අය කාෆිර් වන බවත් දෙවන කාණ්ඩය අකීදා සංකල්ප ස්වයං බුද්ධිය තුළින් වටහා ගත යුතු බවත් විශ්වාස කරයි.

(5) පළමු කාණ්ඩය අලි (රලි), උස්මාන් (රලි) වැනි සහාබිවරුන් යුක්තිසහගත අය බවත්, දෙවන කාණ්ඩය මහා පාපීය ක්‍රියා කළ අය මුඃමිනුත් නොවේ කාෆිර් ද නොවේ යන මතය දරයි.

**45.** ෆික්හ් ක්ෂේත්‍ර ඉතිහාසයේ ඉජ්තිහාද් කිරීමේ අවස්ථා අවුරා දැමීම නිසා සිදු වූ අනිටු විපාකවලින් එකක් වන්නේ කුමක් ද?

(1) මුජ්තහිද් මුත්ලක්වරුන් එක දිගට ම  බිහි වීම.

(2) තක්ලීද් මානසිකත්වයෙන් සමාජය නිදහස් වීම.

(3) මද්හබ් සංකල්ප ග්‍රන්ථාරූඪ වීම.

(4) මද්හබ් සංකල්පවලින් බැහැර වීම.

(5) කාලීන ප්‍රශ්නවලට විසඳුම් ලබාදීම.

**46.** ඉස්හාක් ඉබ්නු රාහවෙහි (රහ්), අලි ඉබ්නු මදීනි (රහ්) යන ගුරුවරුන්ගෙන් අධ්‍යාපනය ලබා හදීස් ක්ෂේත්‍රයේ වියතුන් වූයේ,

(1) ඉමාම් බුහාරී (රහ්) ය.

(2) ඉමාම් මුස්ලිම් (රහ්) ය.

(3) ඉමාම් අබුදාවුද් (රහ්) ය.

(4) ඉමාම් ඉබ්නුමාජා (රහ්) ය.

(5) ඉමාම් තිර්මිති (රහ්) ය.

**47.** කලීෆා අබුබකර් (රලි) තුමාගේ සමයේ අල්කුර්ආනය ඒකරාශී කරනු ලැබීමට හේතු වූ කරුණු අතර වඩාත් ම නිවැරදි කරුණ වන්නේ,

(1) අල්කුර්ආනය වනපොත් කළ හාෆිල්වරුන් බොහෝමයක් මරණයට පත්වීම ය.

(2) අල්කුර්ආනය පාරායනය කිරීමෙහි ලා වෙනස්කම් ඇති වීම ය.

(3) අහ්ලුස් සුන්නා - ෂීආ වැනි කණ්ඩායම් බිහි වීම ය.

(4) හුදයිෆුතුල් යමානි (රලි) තුමා විසින්  උපදෙස් ලබා දීම ය.

(5) නබි (සල්) තුමන් මරණයට පත් වීම ය.

**48.** අපරාධ හා දඬුවම් පිළිබඳ පහත දැක්වන ප්‍රකාශවලින් ඉස්ලාමීය දෘෂ්ටියෙන් වැරදි ප්‍රකාශ වන්නේ කුමක් ද?

(1) අල්ලාහ් සහ රසූල් විසින් අනිවාර්ය කළ දෙයක් නොකර පැහැරහැරීම හෝ තහනම් කළ දෙයක් කිරීමත් වරදක් සේ සැලකීමය.

(2) ''අල් හදූද්'' යනු දඬුවම් මොනවා දැයි යන්න නිර්ණය කර ඇති අපරාධවලට ය.

(3) හුදූද් හා සම්බන්ධ අපරාධයක දී ඒ සඳහා වූ දඬුවම් අපරාධකරුවන්ගේ ස්වභාවය අනුව වෙනස් වන සුලු ය.

(4) විනිශ්චය කරනු ලබන දඬුවම අපරාධ සිදුනොවී වළක්වාලන එකක් විය යුතු ය.

(5) ඉස්ලාමීය දඬුවම් තනි පුද්ගලයන්, ආරක්ෂා කිරීම ඉලක්ක කොට ඇත.

**49.** පහත සඳහන් කරුණු අතුරින් ''අර්කානුල් කියාස්'' හා සම්බන්ධ වඩාත් ම නිවැරදි කාණ්ඩය කුමක් ද?

(1) අස්ල්, ෆරු, ඉල්ලත්, හුක්ම්

(2) අස්ල්, ඉල්ලත්, සබබ්, හුක්ම්

(3) ෆරු, ඉල්ලත්, උර්ෆ්, සනද්

(4) සනද්, හුක්ම්, ඉල්ලත්, සබබ්

(5) අස්ල්, ෆරු, වාජිබ්, ඉල්ලත්

**50.** ෆික්හ් කලාව හා සම්බන්ධව පහත සඳහන් ප්‍රකාශ අතර වඩාත් ම නිවැරදි ප්‍රකාශ වන්නේ කුමක් ද?

(1) ඉමාම් මලික් (රහ්) තුමා සිය නීති සම්පාදනය සඳහා කවුල් ජදීද්, කවුල් කදීම් යන පද යොදා ගෙන ඇත.

(2) ඉමාම් ෂාෆිඊ (රහ්) සහ ඉමාම් අබු හනීෆා (රහ්) යන දෙදෙනා නීති සම්පාදනයේ දී, එකම ප්‍රවේශ ප්‍රතිපත්තියක් අනුගමනය කළ හ.

(3) ඉමාම් අබු හනීෆා (රහ්) තුමා තම නීති සම්පාදනයේ දී බුද්ධියට මෙන් ම පර්යේෂණාත්මක තීරණවලට මුල්තැන දී ඇත.

(4) ඉමාම් අහමද් ඉබ්නු හන්බල් (රහ්) තුමාගේ ''මජල්ලතුල් අහ්කාම් අල් අද්ලියා'' නම් වූ නීති ග්‍රන්ථයක් සම්පාදනය කළේ ය.

(5) ෆික්හුල් අක්බර් නම් වූ නීති ග්‍රන්ථය ෂාෆි මද්හබය මත පදනම් ව සම්පාදනය කර ඇත.

* * *

# (44) ඉස්ලාම්

II **පත්‍රය**

* **I** කොටසින් ප්‍රශ්න **දෙකක්ද**, **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරා ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**I කොටස**

**1. (i)** තස්කියතුන් නෆ්ස් යන්න නිර්වචනය කරන්න. (ලකුණු 02යි.)

**(ii)** තස්කියතුන් නෆ්ස් හි වැදගත්කම අල්කුර්ආන් වාක්‍ය හා අල් හදීස් වැකි උපුටා දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි.)

**(iii)** තස්කියතුන් නෆ්ස් තුළින් දෛනික ජීවිතයේ දී යමෙකුට ලැබෙන ප්‍රතිලාභ හතරක් සඳහන් කොට ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 06යි.)

**(iv)** තස්කියතුන් නෆ්ස් තවදුරටත් වර්ධනය කර ගැනීමට ඉවහල් වන මාර්ග හතරක් පැහැදිලි කොට ඒවායින් දෙකක් ඔබේ ජීවිතයේ ක්‍රියාත්මක කළ ආකාරය පහදන්න. (ලකුණු 08යි.)

**2. (i)** මුරාබහා සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 02යි.)

**(ii)** ව්‍යාපාරික කටයුතුවල තහනම් කර ඇති අංග හතරක් සඳහන් කර ඉන් දෙකක් සම්බන්ධ ව කෙටියෙන් පහදන්න. (ලකුණු 04යි.)

**(iii)** ඉපයීම සම්බන්ධයෙන් ඉස්ලාම් දක්වා ඇති වැදගත්කම සම්බන්ධ අල් කුර්අන් සහ අල් - හදිස් ඇතුළු තර්කානුකූල අදහස් තුනක් ගෙන හැර දක්වා ඒ සෑම එකක්ම පහදන්න. (ලකුණු 06යි.)

**(iv)** ආර්ථික විෂමතාව අවම කිරීමට ඉස්ලාම් දහම ඉදිරිපත් කළ විසඳුම් 4ක් සඳහන් කර ඒවායින් දෙකක් දෛනික ජීවිතය හා සම්බන්ධ කර පහදන්න. (ලකුණු 08යි.)

**3. (i)** මහ්රම් අජ්නබි යන පද නිර්වචනය කරන්න. (ලකුණු 02යි.)

**(ii)** විවාහ වීමේ වැදගත්කම සම්බන්ධ ඉස්ලාමීය ඉගැන්වීම් හතරක් ගෙන හැර දක්වමින් ඉන් දෙකක් සම්බන්ධ ව කෙටියෙන් පහදන්න. (ලකුණු 04යි.)

**(iii)** ස්වාමිපුරුෂයා ගේ හා බිරිඳගේ වගකීම් තුනක් වෙන් වෙන්ව ලැයිස්තුගත කර එම කරුණු යහපත් පවුල් ජීවිතයකට කෙසේ දායක වන්නේ ද යන්න ඉස්ලාමීය ඉගැන්වීම් මත සාධාරණීකරණය කරන්න. (ලකුණු 06යි.)

**(iv)** පවුල් ජීවිතයේ දී උද්ගත වන ප්‍රශ්න වළක්වා ගැනීම සඳහා පිටිවහලක් වන ඉස්ලාමීය මඟ පෙන්වීම් හතරක් සඳහන් කර ඒවා ප්‍රායෝගික ජීවිතයේ දී අනුගමනය කළ යුතුය යන්න සනාථ කිරීමට ඔබගේ පාර්ශ්වයෙන් සාධාරණීකරණය කළ හැකි කරුණු හතරක් ඉදිරිපත් කරන්න. (ලකුණු 08යි.)

## II කොටස

**4. (i)** ජාතීන් අතර සහජීවනය හා සංහිඳියාව ඇති කිරීමට ඉස්ලාම් හඳුන්වා දෙන ආදර්ශ පහක් සඳහන් කර ඒවා ශ්‍රී ලංකාවේ ප්‍රායෝගික ව ක්‍රියාත්මක කළ හැකි ආකාරය නිදසුන් සමගින් විස්තර කරන්න. (ලකුණු 10යි.)

**(ii)** ආගමික හා සමාජීය සංහිඳියාව ක්‍රියාවට නැංවීමේ දී ඒ සඳහා මස්ජිද්වල දායකත්වය හා සම්බන්ධ කරුණු පහක් සඳහන් කර ඒවා ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීමට අවශ්‍ය කරන යෝජනා පහක් ඉදිරිපත් කොට විස්තර කරන්න. (ලකුණු 10යි.)

**5. (i)** ඉස්ලාමීය නීති සම්පාදනයේ දී සුන්නාහි වැදගත්කම උදාහරණ පහක් මගින් විස්තර කරන්න. (ලකුණු 10යි.)

**(ii)** ෆික්හ් ක්ෂේත්‍රයේ මතු විය හැකි මතභේදාත්මක අවස්ථා වල දී මුස්ලිම්වරයෙකු අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙත් පහක් සඳහන් කර ඒ සඳහා සුදුසු නිදසුන් ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

**6. (i)** ඉස්ලාම් දහම තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ පහක් සඳහන් කොට ඒ තුළින් ''ඉස්ලාම් යනු පරිපූර්ණ ජීවන ක්‍රමයකි'' යන්න සාධක සහිත ව ඔප්පු කරන්න. (ලකුණු 10යි.)

**(ii)** ඉස්ලාමීය අකීදාව තුළ හටගත් පරස්පර විරෝධී මත දරන කණ්ඩායම් පහක් සම්බන්ධ ව කෙටියෙන් විස්තර කොට ඒවා සමාජය තුළ ඇති කළ අනිටු විපාක පහක් පහදන්න. (ලකුණු 10යි.)

**7. (i)** මකාසිදුෂ් ෂරීආ යනු කුමක්ද? මෙම ක්ෂේත්‍රයට අදාළ ඉතිහාසය කෙටියේ පහදන්න. (ලකුණු 10යි.)

**(ii)** මකාසිදුෂ් ෂරීආ හි පාරම්පික වර්ගීකරණ තුන ම නම් කොට එම කරුණු එකින් එක පහදන්න. (ලකුණු 10යි.)

**8.** පහත සඳහන් මාතෘකා සම්බන්ධ ව කෙටි සටහන් ලියන්න.

**(i)** බයිතුල් මාල් (ලකුණු 05යි.)

**(ii)** මුජ්තහිද්වරුන් හා ඔවුන්ගේ වර්ගීකරණය (ලකුණු 05යි.)

**(iii)** ශ්‍රී ලංකාවේ ඉස්ලාම්හි හඳුන්වාදීම (ලකුණු 05යි.)

**(iv)** අත්තෘමීන් (ලකුණු 05යි.)

* * *